(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 16.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 සැප්තැම්බර් 22 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹෑපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෛයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1.**කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(අ) වගන්තිය ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි අභියෝගයට ලක් කරන ලද "ඛනිජ තෙල් නිෂ්පාදන ( විශේෂ විධිවිධාන) ( සංශෝධන )" නම් වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන්වූ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුව වෙත දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පතෙහි විධිවිධාන සම්පූර්ණයෙන් සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පහත දැක්වෙන තීන්දුව ලබාදී ඇත :-

පනත් කෙටුම්පතෙහි 3 (2) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(අ) වගන්තිය හා අනනුකූල වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 වගන්තියෙහි (2) වන ඡේදයෙහි විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය වන විශේෂ බහුතර ඡන්දයකින් පමණක් සම්මත කළ හැකිය. පහත ඇතුලත් කිරීම් මඟින් කාරක සභාවෙහි සංයුතිය වෙනස් කළහොත් අනනුකූලතාවය ඉවත් වනු ඇත:-

1. ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා.

2. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා.

පනත් කෙටුම්පතෙහි 7 වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4(ඇ) වගන්ති හා අනනුකූල වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 වගන්තියෙහි (2) වන ඡේදයෙහි විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය වන විශේෂ බහුතර ඡන්දයකින් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මහජනතාව විසින් ජනමත විචාරණයකින් අනුමත කරනු ලැබීමෙන් පමණක් සම්මත කළ හැකිය.

පනත් කෙටුම්පත, සමස්තයක් ලෙස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව හා අනනුකූල වේ. පනත් කෙටුම්පතට පහත සඳහන් වගන්තිය ඇතුළත් කරනු ලබන්නේ නම්, මෙම අනනුකූලතාවය ඉවත්වනු ඇත:—

'අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද කමිටුව අල්ලස් පනතෙහි අර්ථය තුළ උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර එකී පනතෙහි විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය'

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින සභාවේ කටයුතු පිළිබඳ නිල වාර්තාවෙහි මුද්‍රණය කළ යුතු යයි නියෝග කරමි."

II

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව 'විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)'නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

**2.ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අගෝස්තු 23 දිනැති අංක 2294/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි; සහ

(ii)1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අගෝස්තු 23 දිනැති අංක 2294/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි

පිළිගන්වා එම රෙගුලාසි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 අංක 30 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2022.08.01 සිට 2022.08.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින්—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 මාර්තු 30 දිනැති අංක 2273/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන සමාජ විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 මාර්තු 30 දිනැති අංක 2273/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වන ලදී.

එම ලේඛන, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

3.**කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) වරාය, නාවික හා සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 වන සහ 69 වන වගන්ති යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය;

(ii) 2020 වර්ෂය සඳහා (සීමාසහිත) ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ වාර්ෂික වාර්තාව;

(iii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iv) 2020 වර්ෂය සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(v) 2017/2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(vi) 2018/2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(vii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත;

(ii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(iv) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(v) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(vi) 2020 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව; සහ

(vii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4.ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත**: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(පූ.භා.11.52 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 4 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනිවර කියවිය යුතු ය"යි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**5.සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග:** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2010

අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු, 117 වගන්තිය යටතේ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 03 දිනැති අංක 2078/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු, 117 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූනි 06 දිනැති අංක 2283/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6.පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 8, 9, 19, 50, 52, 54, 55, 57, 58, 68, 70, 72, 111, 112, 119, 120, 121 සහ 122 දරන ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2022 සැප්තැම්බර් 07 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් මතු දැක්වෙන තත් කාරක සභා නිර්දේශ පිළිගත යුතු ය:—

**1. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

8. (1) පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන්නේ නම් මිස, එක් එක් මාසයේ පළමුව යෙදෙන ඉරිදාට පසුව එළැඹෙන සතියෙන් ආරම්භ කරමින් ඒ ඒ සතියේ අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවල දී එක් එක් මාසයේ පළමුවැනි සහ තුන්වැනි සති දෙකේ දී පාර්ලිමේන්තුව රැස්වනු ලැබිය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුවේ රැස්වීම පූ. භා. 9.30 ට ආරම්භ කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් කැඳවනු ලබන රැස්වීමක්, ඒ සඳහා ජනාධිපතිවරයා විසින් කරනු ලබන දැනුම් දීමෙන් නියම කර ඇති වේලාවට ආරම්භ කරනු ලැබිය යුත්තේ ය.

(3) පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන්නේ නම් මිස, පාර්ලිමේන්තු රැස්වීම් දිනවල, අ.භා. 12.30 ට සලකා බැලීමට භාජනය වෙමින් පවතින යම් කටයුත්තක් පිළිබඳව වැඩකටයුතු ප්‍රශ්නය නොවිමසා අත්හිටවනු ලැබ, අ.භා. 1.00 ට නැවත ආරම්භ කරනු ලැබිය යුත්තේ ය.

(4) කථානායකවරයා විසින්, අ.භා. 5.30ට ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුත්තේ ය.

(5) අ.භා. 4.30 ට එම අවස්ථාවේ දී සැලකිල්ලට භාජනය වෙමින් පවතින යම් කටයුත්තක් පිළිබඳ වැඩකටයුතු අත්හිටවනු ලැබිය යුතු අතර, එවිට පාර්ලිමේන්තුව කාරක සභා අවස්ථාවේ පසු වේ නම් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් මූලාසනයෙන් ඉවත්ව පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. තව ද, පාර්ලිමේන්තුව හෝ විවාදය හෝ කල් තබනු ලැබිය යුතු බවට හෝ කාරක සභා අවස්ථාවේ දී මූලාසනාරූඪ මන්ත්‍රීවරයා වෙත ප්‍රගතිය වාර්තා කරනු ලැබිය යුතු බවට හෝ ආසනයෙන් ඉවත් වනු ලැබිය යුතු බවට හෝ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එවැනි සෑම පමා කිරීමේ යෝජනාවක් ම ප්‍රශ්නය නොවිමසා අවලංගු විය යුත්තේ ය:

එසේ වුව ද, වැඩකටයුතු අත්හිටවනු ලැබූ විට 46 වැනි ස්ථාවර නියෝගය ප්‍රකාරව විවාදය අවසන් කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එවැනි යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, හෝ ඒ වනවිට එම ස්ථාවර නියෝගය ප්‍රකාරව වැඩකටයුතු කරමින් පවතී නම්, ඉන් මතු වන ප්‍රශ්නය එම ස්ථාවර නියෝගයේ විධිවිධාන සලසා ඇති ආකාරයට ඉදිරිපත් කරනු ලැබ ඇති වැඩිමනත් වූ යෝජනාවක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කරනු ලබන තෙක් කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා හෝ මූලාසනයෙන් ඉවත් වනු නොලැබිය යුත්තේ ය.

(6) අ.භා 4.30 ට සැලකිල්ලට භාජනය වෙමින් පවතින වැඩකටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කර අවසන් කරනු ලැබීමෙන් අනතුරුව කවර හෝ මන්ත්‍රීවරයකු විරුද්ධ වන, කිසි ම වැඩකටයුත්තක් සලකා බැලීම සඳහා ගනු නොලැබිය යුත්තේ ය.

(7) මෙම ස්ථාවර නියෝගයෙහි (4) සහ (5) ඡේදවල විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණ ද, එවකට සිදුකරමින් පවතින පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සමාප්ත කිරීමේ කාර්යය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් දැනුම් දීමකින් තොරව කරනු ලබන යෝජනාවක් මත සභාවේ පැමිණ සිටින මන්ත්‍රීවරයන් බහුතරයකගේ එකඟත්වය පළ කරනු ලැබ ඇත්නම්, පාර්ලිමේන්තුව විසින් රැස්වීම් පවත්වනු ලබන කාල වේලාවන් දීර්ඝ කිරීම කරනු ලැබිය හැකි ය.

**2.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 9 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

9. ප්‍රධාන කටයුතු ආරම්භයේ දී, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව නිශ්චිතව සඳහන් කරනු ලබන යම් වැඩකටයුත්තක් පිළිබඳ කටයුතු යම් නිශ්චිත දිනයක රැස්වීමේදී 8 වැනි ස්ථාවර නියෝගයේ විධිවිධානවලින් නිදහස් විය යුතු බවට යෝජනාවක් කරනු ලැබිය හැකි අතර, එවැනි යෝජනාවකට එකඟත්වය ලැබ ඇත්නම්, එසේ නිශ්චිතව සඳහන් කරන ලද වැඩකටයුත්ත, අත්හිටවීමට නියම කර ඇති වේලාවේ දී සාකච්ඡාවට භාජනය වෙමින් පවතී නම් එය අත්හිටවීම කරනු නොලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් විරෝධතාවක් ඇති වුව ද කවර වේලාවක දී හෝ එය සලකා බැලීමට ගනු ලැබිය හැකි ය:

එසේ වුව ද, 8 වැනි ස්ථාවර නියෝගය ක්‍රියාත්මක වීමෙන් නිදහස් කරන ලද වැඩකටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම අ.භා. 4.30 න් පසු අවසන් වූ විට, නිදහස් කරන ලද වැඩකටයුතුවල අවසන් විෂයය නිම කරනු ලැබූ වහා ම, කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුත්තේ ය.

**3.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 19 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

19. (1) ප්‍රශ්න අවසාන වූ විට මන්ත්‍රීවරයකු ස්වකීය ස්ථානයේ නැගී සිට හදිසි පොදු වැදගත්කමක් ඇති නිශ්චිත කාරණයක් සාකච්ඡා කිරීම සඳහා කාරණය කුමක්දැයි සඳහන් කරමින් පාර්ලිමේන්තුව කල් තැබීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා ඇතොත් මිස, ප්‍රධාන කටයුතු ආරම්භ කරන තෙක් (අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් හැර) පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) (අ) එවැනි ඕනෑම යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කර ඇති දිනයේ රැස්වීම් පටන් ගැනීමට පෙර ඒ යෝජනාව පිළිබඳව කථානායකවරයාට ලිඛිතව දැනුම් දී, කථානායකවරයාගේ එකඟත්වය ලබා ඇත්නම් ; සහ

(ආ) මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේ අවසරය ලබාගෙන ඇත්නම්; හෝ

(ඇ) පාර්ලිමේන්තුවේ අවසරය ලබා නොදෙන ලදුව, විසි දෙනෙකුට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් ස්වකීය ස්ථානවල සිට ඒ මන්ත්‍රීවරයාගේ ඉල්ලීමට අනුග්‍රහ දැක්වීමට නැඟී සිටිත් නම්;

මිස (1) වැනි ඡේදය යටතේ එවැනි යෝජනාවක් මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය:

එසේ වුව ද, කථානායකවරයා, ස්වකීය එකඟත්වය දීම ප්‍රතික්ෂේප කළහොත් හෝ සාකච්ඡා කිරීමට යෝජනා කර තිබෙන කාරණය රීති විරෝධී යැයි කථානායකවරයා විසින් අදහස් කරන්නේ නම්, යෝජනාව හෝ කථානායකවරයා විසින් අනුමත කරනු ලැබූ ඉන් කොටසක් හෝ පිළිබඳ දැනුම් දීම කියවීමට ප්‍රශ්නය මතුකරන මන්ත්‍රීවරයාට ඉඩ දෙනු ලැබිය හැකි ය. ඉක්බිතිවම, ස්වකීය එකඟත්වය දීම ප්‍රතික්ෂේප කිරීමට හෝ එම යෝජනාව රීති විරෝධී වෙතැයි තීරණය කිරීමට හෝ හේතු වූ කාරණා කථානායකවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුත්තේ ය.

(3) යෝජනාවට එසේ අනුග්‍රහය ලැබේ නම් නැතහොත් පාර්ලිමේන්තුව විසින් අවසර දෙනු ලබන්නේ නම්, එම යෝජනාව පිළිබඳව අ.භා. 3.30 ට පාර්ලිමේන්තුව විසින් ක්‍රියා කරනු ලැබිය යුත්තේ ය.

(4) කවර හෝ එක් දිනකදී එවැනි යෝජනා එකකට වැඩි ගණනක් සඳහා අවසර ඉල්ලනු නොලැබිය යුත්තේ ය.

(5) ආණ්ඩුවේ වැඩකටයුතු මුඛ්‍යස්ථානය ගන්නා දිනවල දී මේ නියෝගයෙහි විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් හැර, පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවක් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, ඒ දිනට නියමිත වැඩකටයුතු අතරතුරෙහි දී අ.භා. 4.30 ට පෙර එවැනි යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය.

**4. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 50 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

50 (1) යම් අමාත්‍යවරයකු විසින්**,** දැනුම් දීමෙන් අනතුරුව පනත් කෙටුම්පතක් හඳුන්වා දීම සඳහා පාර්ලිමේන්තුවේ නියෝගයක් නොමැතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ප්‍රධාන කටයුතු ආරම්භයේ දී පනත් කෙටුම්පතක් එසේ ඉදිරිපත් කරනු ලැබූ විට මහ ලේකම්වරයා විසින් පනත් කෙටුම්පතේ නාමය කියවනු ලැබිය යුතු අතර, එවිට, පනත් කෙටුම්පත පළමුවැනි වර කියවන ලදුව එය මුද්‍රණය කරනු ලැබිය යුතු බවට නියෝග කරන ලද සේ සලකා එය ඉදිරිපත් කරන ලද දිනයේ සිට සතියක් ඇතුළත නොවන දිනයක් එහි දෙවැනි වර කියවීම සඳහා නියම කිරීම ද කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාවේ සඳහන් හදිසි පනත් කෙටුම්පතක් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා හෝ

නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එහි දෙවැනි වර කියවීම සඳහා නියම කරනු ලැබිය යුත්තේ ය.

(2) එවැනි සෑම පනත් කෙටුම්පතක්ම පළමුවැනි වර කියවීම නිම වූ වහාම යෝජනාවක් නොමැතිව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කරනු ලැබිය යුත්තේ ය. කාරක සභාව විසින් පනත් කෙටුම්පතට සංශෝධන යෝජනා කරනු ලැබිය හැකිය. කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ආපසු වාර්තා කරන තෙක් හෝ පාර්ලිමේන්තුව විසින් එසේ වාර්තා කිරීමට ලබා දී ඇති කාලය ඉකුත් වන තෙක් පාර්ලිමේන්තුව විසින් ඒ පිළිබඳව කිසිදු පියවරක් ගනු නොලැබිය යුත්තේ ය.

(3) අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ ආපදා කළමනාකරණයට අදාළ යම් කාරණයක කාර්යය සඳහා වහා අවශ්‍ය වන්නා වූ ද, ඒ බවට අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ අත්සන ඇති සටහනක් දරන්නා වූ ද, පනත් කෙටුම්පතකට අදාළව ජනාධිපතිවරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයා අමතා යවන ලද යොමු කිරීමක පිටපතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122(1) ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයා වෙත ලැබී ඇති අවස්ථාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122(1)(ඇ) ව්‍යවස්ථාව මඟින් විධිවිධාන සලසා ඇති පරිදි කථානායකවරයාට ශ්‍රේෂ්ඨාධිකරණය වෙතින් එහි තීරණය ලැබෙන තුරු එකී පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුත්තේ ය.

**5. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

52. (1) පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අදහස් කරනු ලබන යම් පෞද්ගලික මන්ත්‍රීවරයකු විසින් එම පනත් කෙටුම්පතේ අරමුණ සහ එහි මුඛ්‍යාංගයන් සඳහන් කරමින් එය ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තුවේ අවසරය ඉල්ලා සිටිනු ලැබිය යුත්තේ ය.

(2) එවැනි සෑම ඉල්ලීමක් ම යෝජනාවක් ආකාරයෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම ඉල්ලීම කරනු ලබන මන්ත්‍රීවරයා විසින්, යෝජිත පනත් කෙටුම්පතේ සිංහල හා දෙමළ භාෂා පිටපත් ඉංග්‍රීසි අනුවාදයක් ද සිය යෝජනාවේ පිටපතක් ද සමඟ මහ ලේකම්වරයාට භාර දෙනු ලැබිය යුත්තේ ය.

(3) පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන්නත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනයට අදාළව යම් බාධාවක් තිබේ ද යන්නත්, පිළිබඳව නීතිපතිවරයාගේ මතය විමසා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් එම පනත් කෙටුම්පත නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබිය යුත්තේ ය. නීතිපතිවරයා විසින් සිය නිරීක්ෂණ සති හයක කාලසීමාවක් ඇතුළත දී පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ලැබිය යුත්තේ ය.

(4) නීතිපතිවරයාගේ මතය ලැබීමෙන් අනතුරුව මහ ලේකම්වරයා විසින් එම පනත් කෙටුම්පත එහි ඉංග්‍රීසි අනුවාදය ද සමඟ සිංහල සහ දෙමළ භාෂාවලින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සලස්වනු ලැබිය යුත්තේ ය.

(5) පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින හතක කාලයක් ඉකුත් වීමෙන් අනතුරුව කවර හෝ වේලාවක ඉහත (2) වැනි ඡේදයේ දක්වා ඇති

යෝජනාව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේය.

(6) ප්‍රශ්නය සභාභිමුඛ කරනු ලැබ සභාව විසින් සම්මත කරනු ලැබීමෙන් අවසරය දෙන ලදුව හෝ සභාව විසින් අවසරය ලබා නොදුන් අවස්ථාවක දී, එහෙත් මන්ත්‍රීවරයාට සහාය පළ කිරීමට විස්සකට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් සිය අසුන්වලින් නැඟී සිටින අවස්ථාවක දී, පනත් කෙටුම්පත පළමුවැනි වර කියවන ලද සේ සලකා මුද්‍රණය කිරීමට නියෝග කරනු ලැබූ පසු සාකච්ඡාවකින් තොරව එය අදාළ වන විෂයය හා කාර්යය භාර අමාත්‍යවරයාට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ එවැනි අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු හෝ නොමැති නම් කථානායකවරයා විසින් නම් කරනු ලබන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු හෝ වෙත එය යොමු කරනු ලැබිය යුත්තේ ය. පනත් කෙටුම්පත යොමු කරනු ලැබූ අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබන තෙක් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කිසිදු ඉදිරි පියවරක් ගනු නොලැබිය යුත්තේ ය.

(7) ඉහත (6) වැනි ඡේදයේ දක්වා ඇති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව හෝ පනත් කෙටුම්පත අමාත්‍යවරයාට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ යොමු කරන ලද දින සිට එම අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් නොකර මාස හයක් ඉකුත් වීමෙන් අනතුරුව එම පනත් කෙටුම්පත භාර මන්ත්‍රීවරයා රිසි දිනයක එය දෙවැනි වර කියවීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.

**6. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 54 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

54. පෞද්ගලික අයිතිවාසිකම් හෝ බැඳියාවන් කෙරෙහි යම් පනත් කෙටුම්පතක් මඟින් විශේෂ බලපෑමක් ඇති වන යම් අවස්ථාවක දී, එසේ බලපෑමට ලක්වන යම් පාර්ශ්වයක් විසින් එම පනත් කෙටුම්පත පවරනු ලැබ ඇති යෝග්‍ය ආංශික අධීක්ෂණ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පෙත්සම් ඉදිරිපත් කරනු ලැබුවහොත්, එවිට එම අයට ඒ කාරක සභා ඉදිරියෙහි පෞද්ගලිකව හෝ නීතිඥයකු මාර්ගයෙන් පෙනී සිට කරුණු ඉදිරිපත් කරනු ලැබීමට හැකි ය.

**7. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 55 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

55. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාව යටතේ පනත් කෙටුම්පතක් හැර, වෙනත් පනත් කෙටුම්පතක් එය ඉදිරිපත් කරන ලද දිනයේ සිට සතියකට කලින් නොවන යම් දිනයක දෙවැනි වර කියවීම සඳහා නියම කරනු ලැබිය යුත්තේ ය.

(2) යම් පනත් කෙටුම්පතක් හෝ එහි යම් විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වැනි ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ

බලය ක්‍රියාත්මක කරනු ලැබ, එහි පිටපතක් කථානායකවරයාට භාර දෙනු ලැබ ඇති අවස්ථාවක දී :—

(අ) එම යොමු කරනු ලැබීම හෝ පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබීම එසේ යොමු කරනු ලැබීම හෝ පෙත්සම ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව පැවැත්වෙන ප්‍රථම පාර්ලිමේන්තු රැස්වීම් දිනයේ දී කථානායකවරයා විසින් ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවට දැන්වීමක් කරනු ලැබිය යුත්තේ ය;

(ආ) එම පනත් කෙටුම්පත පිළිබඳ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කථානායකවරයාට දන්වනු ලබන තෙක් හෝ එම යොමු කරනු ලැබීම හෝ පෙත්සම ඉදිරිපත් කරනු ලැබීම කළ දිනයේ සිට සති තුනක කාලයක් ඉකුත් වන තෙක් හෝ යන මේ දෙකෙන් පළමුව එළැඹෙන අවස්ථාව තෙක් එවැනි පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගනු නොලැබිය යුත්තේ ය;

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ලැබීමෙන් අනතුරුව, කථානායකවරයා විසින් එකී තීරණය පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබිය යුතු අතර, එම නිවේදනය සම්බන්ධයෙන් කිසිදු විවාදයකට අවසර දෙනු නොලැබිය යුත්තේ ය.

**8. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 57 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

57. අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාවකින් අනතුරුව පනත් කෙටුම්පතක් දෙවැනි වර කියවා ඇති අවස්ථාවක දී, එම පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමේ දී පාර්ලිමේන්තුව විසින් එසේ තීරණය කරනු ලැබුවහොත් වාර්ෂික හෝ පරිපූරක විසර්ජන පනත් කෙටුම්පතක් හැර, වෙනත් යම් පනත් කෙටුම්පතක් කථානායකවරයා විසින් නම් කරනු ලබන විශේෂ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරනු ලැබිය හැකි ය.

**9. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 58 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

58. පනත් කෙටුම්පතක් විශේෂ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරනු ලැබූ අවස්ථාවක දී, එම කාරක සභාව විසින් ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වාර්තා කරන තෙක් ඒ පිළිබඳව කිසිම ඉදිරි පියවරක් ගනු නොලැබිය යුත්තේ ය.

**10. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 68 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

68. පනත් කෙටුම්පතක් යොමු කරනු ලැබ ඇති ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාව හෝ විසින් සිය නිර්දේශ සඳහන් වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාවේ පිටපතක් සෑම මන්ත්‍රීවරයකුට ම බෙදා දෙනු ලැබිය යුත්තේ ය.

**11.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 70 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

70. පනත් කෙටුම්පතක් පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ හෝ විශේෂ කාරක සභාවේ වාර්තාව සභාපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුව නියම කරනු ලබන දිනක දී සලකා බැලීම සඳහා කටයුතු කරනු ලැබිය යුත්තේය. ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ හෝ විශේෂ කාරක සභාවක හෝ වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් සලකා බැලිය යුත්තේ කාරක සභාව විසින් කරන ලද සංශෝධන ඇතොත් එපමණය. එහෙත් එම සංශෝධන තවදුරටත් සංශෝධනය කරනු ලැබිය හැකි ය. එම වාර්තාව සලකා බලනු ලැබීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් පිළිගන්නා ලද කාරක සභා සංශෝධනවලට ආනුෂංගික වන්නාවූ සංශෝධන හැර කිසිම අලුත් සංශෝධනයක් පාර්ලිමේන්තුව විසින් කරනු නොලැබිය යුත්තේ ය. එහෙත් එම කාරක සභාව විසින් කරන ලද සංශෝධන සම්බන්ධයෙන් පනත් කෙටුම්පත නැවතත් එම කාරක සභාවටම යොමු කරනු ලැබිය හැකි ය.

**12.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 72 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

72. (1) පනත් කෙටුම්පතක් සංශෝධන රහිතව ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාවක් විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබ ඇති විට, එය සලකා බැලීමට නියම කරන ලද දිනයේ දී වහා ම තුන්වැනි වර කියවා සම්මත කරනු ලැබිය හැකි ය; නැතහොත්, පාර්ලිමේන්තුව විසින් එසේ විධාන කරනු ලබන්නේ නම්, තුන්වැනි වර කියවීම කල් දමනු ලැබිය හැකි ය.

(2) පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාවක් හෝ විසින් සංශෝධනය කර තිබේ නම්, කාරක සභාව මඟින් කරන ලද සංශෝධන පාර්ලිමේන්තුව විසින් සලකා බැලීම අවසන් කළ වහාම පනත් කෙටුම්පත තුන්වැනි වර කියවා සම්මත කරනු ලැබිය හැකි ය, නැතහොත්, පාර්ලිමේන්තුව විසින් එසේ විධාන කරනු ලබන්නේ නම්, තුන්වැනි වර කියවීම කල් දමනු ලැබිය හැකි ය.

**13.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

111.(1) තේරීම් කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන විෂයයන් සහ කාර්යයන් පැවරෙන ආංශික අධීක්ෂණ කාරක සභා විස්සකට නොවැඩි සංඛ්‍යාවක් තිබිය යුත්තේ ය.

(2) ආංශික අධීක්ෂණ කාරක සභා පාර්ලිමේන්තුවේ කාලය තුළ දී ක්‍රියාත්මක විය යුතු අතර, පාර්ලිමේන්තුවේ යම් කල් තැබීමක් හෝ වාරාවසාන කිරීමක් නොසලකා එහි විමර්ශන කටයුතු පවත්වාගෙන යනු

ලැබිය යුත්තේ ය.

(3) ආංශික අධීක්ෂණ කාරක සභාවලට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාවේ දක්වා ඇති පනත් කෙටුම්පත් හැර කාරක සභාවට යොමු කරනු ලබන වෙනත් යම් පනත් කෙටුම්පතක්, ගිවිසුමක්, කාරක සභාවේ විෂය පථයට යටත් වන ආයතනවල වාර්ෂික වාර්තා සහ කාර්යසාධන වාර්තා ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමුකරන ලද වාර්තාවක් හෝ කාරණාවක් හෝ යම් කාරක සභාවක් හෝ අමාත්‍යවරයෙකු හෝ විසින් එහි අධිකාර බල සීමාව තුළ ඇති විෂයයන් සහ කාර්යයන්ට අදාළ වෙනත් යම් කාරණයක් විභාග කිරීමට බලය තිබිය යුත්තේ ය.

(4) ඕනෑම අවස්ථාවක දී, ආංශික අධීක්ෂණ කාරක සභාවලට සිය වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි යැයි එම කාරක සභා විසින් සලකනු ලබන එවැනි විමසීම් සහ විමර්ශන සිදු කරනු ලැබිය හැකි ය.

(5) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව සෑම මාසයකම දින දෙකකට නොඅඩු දින ගණනක් රැස්විය යුත්තේ ය.

(6) ආංශික අධීක්ෂණ කාරක සභාවලට පාර්ලිමේන්තුවේ මතු සඳහන් කාර්යයන් සඳහා පාර්ලිමේන්තුවට සහාය වීම පිණිස පොදු අධීක්ෂණ වගකීම් තිබිය යුත්තේ ය:—

(අ) රජයේ පවතින ප්‍රතිපත්ති අදාළ කර ගැනීම, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම සහ ඒවායෙහි සඵලත්වය පිළිබඳ විශ්ලේෂණය කිරීම, තක්සේරු කිරීම සහ ඇගයීම;

(ආ) විකල්ප ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිණිස අනාගත පර්යේෂණ සහ පුරෝකථන සඳහා වන ක්‍රියාකාරකම්;

(ඇ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන නීති සහ යම් නව හෝ අතිරේක නීතියක් පැනවීමේ අවශ්‍යතාව හෝ යෝග්‍යතාව පෙන්නුම් කරනු ලැබිය හැකි තත්ත්වයන් සහ වාතාවරණයන් අදාළ කර ගැනීම, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම සහ ඒවායෙහි සඵලත්වය පිළිබඳ විශ්ලේෂණය කිරීම, තක්සේරු කිරීම සහ ඇගයීම; සහ

(ඈ) යම් නීතියක් සහ අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි එවැනි යම් අතිරේක නීතියක් සම්පාදනය කිරීම, සලකා බැලීම, පැනවීම හෝ සංශෝධන සිදු කිරීම.

(7) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාවට තම අධිකාර බලසීමාව තුළ ඇති ඕනෑම ආයතනයකට කිසියම් තනතුරකට පත් කර ඇති හෝ ඕනෑම තනතුරක නිලතල දැරීමට නම් කර ඇති ඕනෑම තැනැත්තෙකුගේ යෝග්‍යතාවය පරීක්ෂා කර බලා එම පුද්ගලයන් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කළ හැකි ය.

(8) මතු සඳහන් තැනැත්තන් හැර, පාර්ලිමේන්තුවේ සෑම මන්ත්‍රීවරයකුම යම් ආංශික අධීක්ෂණ කාරක සභාවක සාමාජික මන්ත්‍රීවරයන් ලෙස සේවය කිරීමට සුදුසුකම් ලැබිය යුත්තේ ය:—

(අ) කථානායකවරයා;

(ආ) නියෝජ්‍ය කථානායකවරයා;

(ඇ) නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා;

(ඈ) අග්‍රාමාත්‍යවරයා;

(ඉ) පාර්ලිමේන්තුවේ සභානායකවරයා;

(ඊ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා; සහ

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්.

(9) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 (1) ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන අමාත්‍යවරයන් සහ නියෝජ්‍ය අමාත්‍යවරයන් කටයුතු කරනුයේ කවර අමාත්‍ය මණ්ඩල අමාත්‍යවරයකුගේ විෂය පථය යටතට ගැනෙන යම් විෂයයක්, කාර්යයක්, දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක ද, ඒ හා සමාන අධිකාර බලයක් සහ අදාළ කාර්යය සහිත ආංශික අධීක්ෂණ කාරක සභාවක සේවය කිරීම සඳහා සුදුසුකම් නොලැබිය යුත්තේ ය:

එසේ වුවද, පනත් කෙටුම්පතක් ආංශික අධීක්ෂණ කාරක සභාවක සාකච්ඡාවට භාජනය කරනු ලබන අවස්ථාවක දී, විෂය භාර අමාත්‍යවරයා හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ එම කාරක සභාවට සහාය වීම පිණිස කැඳවනු ලැබිය හැකි ය.

(10) තේරීම් කාරක සභාව විසින්, ආංශික අධීක්ෂණ කාරක සභාවට සභික මන්ත්‍රීවරයන් නම් කිරීමේ දී පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නායකයන් විසින් කරනු ලබන නාමයෝජනාවලට අනුකූලව එම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට නිසි සැලකිල්ල දක්වමින් කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

(11) අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවක සාමාජික මන්ත්‍රීවරයකු නොවන යම්කිසි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් එවැනි කාරක සභාවක කටයුතු නිරීක්ෂණය කරනු ලැබීමට එම කාරක සභාවේ සභාපතිවරයා විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

(12) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව, සිය පළමුවැනි රැස්වීමේ දී සහ ඉන් අනතුරුව එහි සභාපති ධුරය පුරප්පාඩු වීමෙන් අනතුරුව පවත්වනු ලබන පළමුවැනි රැස්වීමේ දී ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභික මන්ත්‍රීවරයන් අතුරින් සභාපතිවරයකු තෝරා පත්කර ගනු ලැබිය

යුත්තේ ය.

(13) යම් ආංශික අධීක්ෂණ කාරක සභාවකින් පූර්ව අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.

(14) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, එම කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් කාරණා විභාග කොට එම කාරක සභාවට වාර්තා කරනු ලැබීම සඳහා, එම කාරක සභාවේ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

(15) පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් විධානය කරනු ලබන්නේ නම් මිස, යම් කාරණයක් ආංශික අධීක්ෂණ කාරක සභාවකට යොමු කිරීමේ දින සිට සති හයක් ඉකුත් වන තෙක්, පාර්ලිමේන්තුව විසින් එම කාරණය සලකා බලනු නොලැබිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මඟින් ඉහත කී කාල සීමාව නිර්ණය කරනු ලැබිය හැකි ය.

(16) සෑම ආංශික අධීක්ෂණ කාරක සභාවක් ම යම් පනත් කෙටුම්පතක් හෝ පොදු වැදගත්කමකින් යුක්ත වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් බලපෑමට ලක්ව සිටින හෝ යම් බැඳියාවක් ඇති පාර්ශ්වයකින් සාක්ෂි කැඳවනු ලැබිය හැකි ය.

(17) සෑම ආංශික අධීක්ෂණ කාරක සභාවකට ම තැනැත්තන් කැඳවනු ලැබීමට සහ ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගනු ලැබීමට බලය තිබිය යුතු අතර ම, එම කාරක සභාව ඉදිරියේ විමසනු ලබන සාක්ෂිවල කාර්ය සටහන් ද සමඟ සිය මත සහ නිරීක්ෂණ අඩංගු වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(18) නීති පැනවීමට හෝ ව්‍යවස්ථාමය නොවන වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ආංශික අධීක්ෂණ කාරක සභාවක් කටයුතු කරනු ලබන අවස්ථාවක දී, අදාළ විෂය පවරනු ලබන සහ අමාත්‍ය වගකීම් දරන කැබිනට් අමාත්‍යවරයා සහ එලෙස පවරා නොමැති අවස්ථාවක අග්‍රාමාත්‍යවරයා විසින් වාර්තාවේ දක්වා ඇති නිර්දේශ සති අටක කාලයක් ඇතුළත ඉටු කළ යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධව තමා විසින් ගැනීමට යෝජනා කරන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතු ය. නිරීක්ෂණ හෝ නිශ්චිත නිර්දේශ ඉටු කළ නොහැකි යැයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, ඊට අමාත්‍යවරයාගේ හේතු ලිඛිතව පැහැදිලි කළ යුතු අතර අමාත්‍යවරයා විසින් යෝජනා කරන විකල්ප ක්‍රියාමාර්ග සඳහන් කළ යුතු ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර, එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුතු ය.

(19) (අ) කාරක සභාව ඉදිරියේ පවතින එක් එක් කරුණු විමසීම් සම්බන්ධයෙන් වයස අවුරුදු 18 සහ 35 අතර වූ තරුණ

නියෝජිතයන් පස්දෙනෙකු (5) ට නොවැඩි පිරිසක් කාරක සභාවට සහාය වීම සඳහා සභාපතිවරයාට කැඳවිය හැකි ය.

(ආ) එසේ කැඳවනු ලබන තරුණ නියෝජිතයන්ට සභාපතිවරයාගේ අවසරය ඇතිව කාරක සභාව ඉදිරියේ ඇති ලේඛන පරීක්ෂා කිරීමට සහ සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමට අවස්ථාව ලබා දිය හැකි ය:

එසේ වුවද, එකී තරුණ නියෝජිතයන්ට කාරක සභාවේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි ය.

(ඇ) කාරක සභාව විසින් ගනු ලබන ඕනෑම තීරණයකට යටත්ව, තරුණ නියෝජිතයින්ගේ අදහස්, නිරීක්ෂණ සහ මතයන් කමිටු වාර්තාවට අතිරේකයක් වශයෙන් ඇතුළත් කිරීමට සභාපතිවරයාට අවසර දිය හැකි ය.

(ඈ) තේරීම් කාරක සභාව විසින් නියම කරන ලද මාර්ගෝපදේශ මත තරුණ නියෝජනය සඳහා තෝරා ගැනීමේ නිර්ණායක තීරණය කරනු ලැබිය යුතු ය.

**14. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

112. (1) පාර්ලිමේන්තුවේ එක් එක් සභා වාරය ආරම්භයේදීම සහ අවශ්‍යතා මතු වන අයුරින් කලින් කලට තේරීම් කාරක සභාව විසින් පහත සඳහන් සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත්, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ සංඛ්‍යාවට සමාන වන්නා වූ “අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා” සංඛ්‍යාවක් පත් කළ යුත්තේ ය:—

(අ) සභාපතිවරයා ලෙස අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා;

(ආ) රාජ්‍ය අමාත්‍යවරයා;

(ඇ) නියෝජ්‍ය අමාත්‍යවරයා; සහ

(ඈ) තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙක්.

(2) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවකින් තම අත්සන යටතේ වූ ඉල්ලීමක් මඟින් පූර්ව අවසරය ලබා නොගෙන ඒ කාරක සභාවේ අනුගාමී රැස්වීම් වාර තුනකට සහභාගි නොවන යම් සාමාජික මන්ත්‍රීවරයකු ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සිය සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලැබිය යුතු අතර තේරීම් කාරක සභාවේ එකඟතාවය මත හැර ඒ සාමාජිකයා ඒ සභාවාරය තුළ නැවත ඒ කාරක සභාවට පත් නොකළ යුත්තේ ය:

එසේ වුව ද, ඒ සාමාජික මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවෙන් නොපැමිණීමේ අවසරය ප්‍රථමයෙන් ලබාගෙන පාර්ලිමේන්තු රැස්වීම්වලට නොපැමිණෙන කාලසීමාවක් තුළ යෙදෙන දිනයකදී ඒ කාරක සභාවක යම් රැස්වීමක් පවත්වනු ලබන්නේ නම්, ඉහත කී විධිවිධාන අදාළ නොවිය යුත්තේ ය.

(3) ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට තමා සාමාජිකයකු නොවන

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක රැස්වීම්වලට ඒ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය පරිදි සහභාගි වීමට අවකාශ ඇති අතර සභාපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවකදී ඒ මන්ත්‍රීවරයා ඉන් ඉවත් විය යුත්තේ ය.

(4) ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් කාරක සභාවට යොමු කරනු ලබන කාරණා සලකා බැලීම සහ සභාපතිවරයා හෝ පාර්ලිමේන්තුව විසින් කාරක සභාවට යොමු කරනු ලබන යෝජනා, නියෝග හෝ ලේඛන ඇතුළුව කවර හෝ කරුණු පිළිබඳ විමසා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක කාර්යය විය යුත්තේ ය.

(5) (අ) කාරක සභා රැස්වීම් කැඳවීම අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සිදු කළ යුත්තේය.

(ආ) පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිවරයා මඟින් කාර්යාරම්භ කිරීමේ බලය අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවකට තිබිය යුත්තේ ය.

(6) සභාපතිවරයා විසින් කැඳවනු ලබන කවර හෝ අවස්ථාවක එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව රැස්විය යුත්තේ ය. සභාපතිවරයා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සභාපතිවරයා විසින් යටත් පිරිසෙයින් මාසයකට වරක් හෝ රැස්වීමක් කැඳවා අර්ථවත්වැඩසටහනක් සකස් කරන බවට වගබලා ගැනීම, සෑම අමාත්‍යාංශ ලේකම්වරයකුගේම කාර්යය වන අතර කලින් කලට එහි නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේ ය:

එසේ වුව ද, එබඳු අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක යටත් පිරිසෙයින් සාමාජික මන්ත්‍රීවරයන් තුන් දෙනකුගේ ලිඛිත ඉල්ලීමක් මත හැකිතාක් ඉක්මනින් රැස්වීමක් කැඳවනු ලැබිය යුත්තේ ය.

(7) කාරක සභාව ඉදිරියට තැනැත්තන් කැඳවා ප්‍රශ්න කිරීමට ද, ලියකියවිලි සහ වාර්තා ගෙන්වා පරීක්ෂා කිරීමට ද, තැනින් තැනට යෑමටද, තමන් වෙත යොමු කෙරෙන කරුණු පූර්ණ ලෙස සලකා බැලීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාවන් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබනු ලැබ ඇති විටක වුව ද රැස්වීමට ද, එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(8) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු අතර නියමිත ගණපූරණය නොමැතිව කටයුතු නොකිරීම ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුත්තේ ය.

(9) කාරක සභා සඳහා වන පොදු රීති අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සඳහා ද අදාළ විය යුත්තේ ය.

**15.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

119. (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ

අමාත්‍යවරුන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම් ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කරනු ලැබීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින්, සෑම මාස තුනකට වරක්, පරීක්ෂා කරන ලද ගිණුම්, මූල්‍ය, මූල්‍ය කාර්ය පටිපාටි හා යම් දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක කාර්ය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය ගැන ද ඉන් පැන නගින යම් කාරණයක් සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. රාජ්‍ය මූල්‍ය නිසි පරිදි පරිහරණය කිරීම සහතික කරලනු වස්, ඊට අදාළ කාරණාවලට විසඳුම් සැපයෙන ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අඩංගු විය යුත්තේ ය.

(4) පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර අමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ නොකළ හැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධව අමාත්‍යවරයා විසින් ගැනීමට යෝජනා කරන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය. නිරීක්ෂණ හෝ නිශ්චිත නිර්දේශය ඉටු නොකළ හැකි යැයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, ඊට අමාත්‍යවරයාගේ හේතු ලිඛිතව පැහැදිලි කළ යුතු අතර අමාත්‍යවරයා විසින් යෝජනා කරන විකල්ප ක්‍රියාමාර්ග සඳහන් කළ යුතුය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිළි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නගින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) කාරක සභාව විසින් නියෝග කරනු ලබන යම් දෙපාර්තමේන්තු සහ පළාත් පාලන ආයතනවල සියලු ගිණුම් හා මුදල් සහ කළමනාකරණය සම්බන්ධව පරීක්ෂාකොට වාර්තා කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි සිය සාමාජිකයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

(ආ) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හෝ කාරක සභාව විසින් පත් කරන ලද ඕනෑම අනු කමිටුවක් අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාව විසින් තීරණය කරනු ලබන ඕනෑම අදාළ ආයතනයක රැස්වීම් පැවැත්වීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(ඇ) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් නොවන වෙනත් යම් මන්ත්‍රීවරයන්ට එම කාරක සභාවේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(6) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හෝ එහි යම් අනු කාරක සභාවක් විසින් සිය කාර්යය ඉටුකරනු ලැබීම සඳහා යම් තැනැත්තකු එම කාරක සභාව ඉදිරියට කැඳවනු ලැබීමට සහ ප්‍රශ්න කරනු ලැබීමට ද, යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා ගෙන පරීක්ෂා කරනු ලැබීමට ද, ගබඩා සහ දේපළවලට ප්‍රවේශ වීමට ද බලය තිබිය යුත්තේ ය.

(7) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුතු ය. පිළිගත හැකි හේතුවක් මත කාරක සභාවේ අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.

**16. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

120 . (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) රාජ්‍ය සංස්ථා සහ මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරන ලද ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක පරීක්ෂා කරන ලද ගිණුම් සම්බන්ධයෙන් සහ ඉන් පැන නඟින යම් කාරණයක් සම්බන්ධයෙන් අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු, මූල්‍ය, මූල්‍ය කාර්ය පටිපාටිය, කාර්ය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්, සෑම මාස තුනකට වරක්, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. රාජ්‍ය මූල්‍ය නිසි පරිදි පරිහරණය කිරීම සහතික කරලනු වස්, ඊට අදාළ කාරණාවලට විසඳුම් සැපයෙන ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අඩංගු විය යුත්තේ ය.

(4) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද අවස්ථාවක දී, එම වාර්තාව මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, ඉන් අනතුරුව මුදල් විෂය භාර අමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක කාල සීමාවක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ නොකළ හැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිළි කළ යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධව අමාත්‍යවරයා විසින් ගැනීමට යෝජනා කරන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය. නිරීක්ෂණ හෝ නිශ්චිත නිර්දේශය ඉටු නොකළ හැකි යැයි අමාත්‍යවරයාගේ මතය වන්නේනම්, ඊට අමාත්‍යවරයාගේ හේතු ලිඛිතව පැහැදිලි කළ යුතු අතර අමාත්‍යවරයා විසින් යෝජනා කරන විකල්ප ක්‍රියාමාර්ග සඳහන් කළ යුතුය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිළි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණ වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියම කරනු ලබන කවර හෝ රාජ්‍ය සංස්ථාවක හෝ කිසියම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පැවරී ඇත්තා වූ යම් ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක සියලුම ගිණුම්, අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු මූල්‍ය තත්ත්වය සහ කළමනාකාරිත්වය පරීක්ෂාකර කාරක සභාවට වාර්තා කරනු ලැබීම පිණිස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අවශ්‍ය යැයි හැඟී ගිය අවස්ථාවක දී, කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

(ආ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හෝ කාරක සභාව විසින් පත් කරන ලද ඕනෑම අනු කමිටුවක් අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාව විසින් තීරණය කරනු ලබන ඕනෑම අදාළ ආයතනයක රැස්වීම් පැවැත්වීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(ඇ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් නොවන වෙනත් යම් මන්ත්‍රීවරයන්ට එම කාරක සභාවේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(6) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් හෝ එහි යම් අනු කාරක සභාවක් විසින් සිය කර්තව්‍ය ඉටුකරනු ලැබීම සඳහා යම් තැනැත්තකු එම කාරක සභාව ඉදිරියට කැඳවනු ලැබීමට සහ ප්‍රශ්න කරනු ලැබීමට ද යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා ගෙන පරීක්ෂා කරනු ලැබීමට ද, ගබඩා සහ දේපලවලට ප්‍රවේශ වීමට ද බලය තිබිය යුත්තේ ය.

(7) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. පොදු ව්‍යාපාර පිළිබඳ පිළිබඳ

කාරක සභාවේ අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියා සේ සලකනු ලැබිය යුත්තේ ය.

**17.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

121. (1) සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු විය යුත්තේ ය යන්නට යටත්ව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සභාපතිවරයකු හා සාමාජික මන්ත්‍රීවරයන් එකොළොස් දෙනකුගෙන් සමන්විත රජයේ මුදල් පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) මතු සඳහන් දේ පරීක්ෂා කරනු ලැබීම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කර්තව්‍ය විය යුත්තේ ය:—

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව යටතේ ආදායම් එකතු කිරීම;

(ආ) ඒකාබද්ධ අරමුදලෙන් කරනු ලබන ගෙවීම්;

(ඇ) නීතිය මගින් යම් විශේෂ කාර්ය සඳහා මහජන අරමුදල් භාවිතා කිරීම;

(ඈ) රජයේ අරමුදල් යෙදවීම;

(ඉ) පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනතේ අඩංගු විසර්ජනවල ආර්ථික අවපාත, විසර්ජන මාරු කිරීම සහ අනපේක්ෂිත ශේෂය;

(ඊ) පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම;

(උ) රාජ්‍ය ණය සහ ණය සේවා;

(ඌ) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ වාර්තා සහ ප්‍රකාශන; සහ

(එ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාව යටතේ පනත් කෙටුම්පත්, යෝජනා, යෝජනා සම්මතයන් සහ නියෝග.

(3) පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් හෝ අමාත්‍යවරයකු හෝ විසින් ඕනෑම කාරණයක් සලකා බලා වාර්තා කිරීම පිණිස රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබිය හැකි ය.

(4) කාරක සභාව විසින්, ඉහත (2) සහ (3) ඡේදයේ දක්වා ඇති කාරණා වලින් පැන නඟින ගැටලු, කලින් කලට, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(5) විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාව ආරම්භ වීමට පෙර කාරක සභාව විසින්—

(i) මුළු ඇස්තමේන්තුගත වියදම් හා ආදායම් සඳහා පදනම ලෙස භාවිතා කෙරෙන බදුකරණය, මූල්‍ය සහ ආර්ථික උපකල්පන පිළිබඳව; සහ

(ii) මුදල් වෙන් කිරීම ආණ්ඩුවේ ප්‍රතිපත්ති සමඟ අනුකූල වන්නේ ද යන්න පිළිබඳව;

වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(6) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව යම් වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අවස්ථාවක දී, එම වාර්තාව මුදල් විෂය භාර අමාත්‍යවරයාට යොමු කරනු ලැබිය යුතු අතර, ඉන් අනතුරුව මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක කාල සීමාවක් ඇතුළතදී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(7) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් යම් තැනැත්තන් කැඳවීමට සහ ලියකියවිලි හා වාර්තා ගෙන්වා ගැනීමට බලය තිබිය යුතු අතර, යෝජනා සහ නිරීක්ෂණ ඇතුලත් වාර්තාව සාක්ෂි සටහන් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(8) කාරක සභාවේ ගණපූරණය සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය.

**18. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 122 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—**

122. (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) 30 වැනි ස්ථාවර නියෝගයේ (10) වැනි ඡේදයේ දක්වා ඇති විධිවිධාන යටතේ කාරක සභාවට යොමු කරනු ලබන පෙත්සම් සලකා බැලීම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන අධිකාරියක හෝ එවැනි වෙනත් යම් ආයතනයක නිලධරයකු විසින් සිදු කරන ලද මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ වෙනත් යම් අසාධාරණයක් යම් පෙත්සමක් මගින් අනාවරණය වන බව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ මතය වන අවස්ථාවක, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් එම පෙත්සම විභාග කරනු ලැබීම හෝ විභාගකොට වාර්තා කරනු ලැබීම සඳහා එය පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(4) කාරක සභාව විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට (ඔම්බුඩ්ස්මන්වරයාට) යොමු කරනු ලැබූ පෙත්සමක් සම්බන්ධයෙන් ඔහු විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවක් කාරක සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ඒ වාර්තාව පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් හෝ කාරක සභාව විසින් සලකා බලනු ලැබූ පෙත්සමක් සම්බන්ධයෙන් ස්වකීය මතය පාර්ලිමේන්තුව වෙත වාර්තා කරනු ලැබිය හැකි ය.

(5) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් නිරීක්ෂණ ද සමඟ ගත යුතු පියවර සම්බන්ධයෙන් සිය මතය, සැම මාස තුනකට වරක්ම, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(6) වාර්තාව පාර්ලිමේන්තුවේදී සභාගත කළ විට, කථානායකවරයා විසින් එම වාර්තාවේ අන්තර්ගත කරුණු අදාළ වන යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ සඳහා එම අමාත්‍යවරයාට යවනු ලැබීමට පියවර ගනු ලැබිය යුතු අතර**,** එම අමාත්‍යවරයා විසින් තම නිරීක්ෂණ සති අටක කාල සීමාවක් ඇතුළත දී කථානායකවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(7) අදාළ යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ ලැබීමෙන් අනතුරුව, එම නිරීක්ෂණවල පිටපතක් කථානායකවරයා විසින් කාරක සභාවේ සභාපතිවරයාට සහ පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ මන්ත්‍රීවරයාට යොමු කරනු ලැබිය යුත්තේ ය: ඒ අනුව ලබා දී ඇති පිළිතුරු සම්බන්ධව සෑහීමකට පත් නොවන්නේ නම්, සුදුසු ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිය යුතුය. අමාත්‍යවරයා මාසයක් ඇතුළත අවශ්‍ය පරිදි කටයුතු කල යුතු අතර, එම කාර්ය ඉටුනොකිරීමට කරුණු ලිඛිතව ඉදිරිපත් කර සලකා බලනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කළ යුතුය.

(8) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන විටක, කාරක සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ මහජන පෙත්සම් හෝ වාර්තා සම්බන්ධයෙන් විභාග කරනු ලැබ කාරක සභාවට වාර්තා කිරීම සඳහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් ම සමන්විත අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

(9) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් හෝ එහි යම් අනු කාරක සභාවක් විසින් කාරක සභාවේ කාර්යය ඉටු කරනු ලැබීම සඳහා කාරක සභාව ඉදිරියට යම් තැනැත්තකු කැඳවා ප්‍රශ්න කිරීමට ද යම් ලියකියවිලි**,** පොත් හෝ වෙනත් ලේඛන ගෙන්වා පරීක්ෂා කරනු ලැබීමට ද ගබඩා සහ දේපළවලට ප්‍රවේශ වීමට ද බලය තිබිය යුත්තේ ය.

(10) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, මූලාසනාරූඪ විය යුතු ය"යි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.04 ට ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, මූලාසනාරූඪ විය.)

"ගරු වේලු කුමාර් මහතා, මූලාසනාරූඪ විය යුතු ය"යි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.42 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා, මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු රෝහණ බංඩාර මහතා, ගරු නිමල් පියතිස්ස මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.30 ට ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා, මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා.4.30 වූයෙන් විවාදය කල් ගියේය. එතැන් සිට විවාදය වෙනත් දිනයක පවත්වනු ලැබේ.

**7. කල් තැබීම (තිරුකෝණේෂ්වරම් කෝවිලේ නීතිවිරෝධි ඉදිකිරීම් සහ බලහත්කාරයෙන් ඉඩම් අත්පත් කර ගැනීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 සැප්තැම්බර් 23 සිකුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.